*සැ. යු.-* මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2024 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,390 - 2024 ජූනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1724 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1731 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූනි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1721- B 82582 — 5,403 (2024/06)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාව - ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවික ශිල්පීන් හා ශිල්පිනියන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි හා කාන්තා අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යෙන් ම සපුරාලිය යුතුය:

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | වයස | - 2024 ජූලි මස 18 වැනි දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24 ට නොවැඩි විය යුතුය. |
| ඇ. | උස | - (පිරිමි) අඩි 5 අඟල් 5 ට (කාන්තා) අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුයි. |
| ඈ. | බර | - (පිරිමි) කි.ග්‍රෑ. 47 (රාත්තල් 105) ට (කාන්තා) කි.ග්‍රෑ. 36 (රාත්තල් 80) ට නොඅඩු විය යුතුයි |
| ඉ. | පපුව | - අඟල් 32 ට නොඅඩු විය යුතුයි. (පිරිමි) |
| ඊ. | වර්ණ දෘෂ්ටිය | - එස්ටීඩී II |
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව) |
| ඌ. | සිවිල් තත්ත්වය | - අයදුම්කරුවන් අවිවාහක විය යුතුයි. **කිසිම ආධුනිකයෙකුට** පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

3. **බඳවාගනු ලබන අංශයන්:**

(අ) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් හෝ ශ්‍රී ලංකා නාවික තාක්ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (නාවික ඉංජිනේරු)
(2) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (මෝටර් රථ ඉංජිනේරු)
(3) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු)
(4) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු)
(5) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (නැව්බඳ අලුත්වැඩියාවන් සහ නැව් තැනීම සම්බන්ධ ඉංජිනේරු)

4. **අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව මව්බස, ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය.

ආ. අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පහත සඳහන් විෂයය ධාරාවලින් පෙනී සිටීම

(1) භෞතික විද්‍යා විෂයය ධාරාව

(2) ජීව විද්‍යා විෂයය ධාරාව

(3) තාක්ෂණවේදය විෂයය ධාරාව (තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන්) ඇතුලත් විය යුතුය.

5. ඉහත 2 සහ 4 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිමි වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

6. සේවා කොන්දේසි :

අ. අපේක්ෂකයින් ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

ආ. පුහුණුව ලබන කාලසීමාව තුළදී හා ඉන් පසුව, ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඇ. සෑම ආධුනිකයෙකුට ම සියලු ආයිත්තම් සහිත නිල ඇඳුම් සහ උපකරණ සපයනු ලැබේ.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ, ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මගින් සපයනු ලැබේ.

ඉ. පුහුණුවන කාලසීමාව තුළ දී, යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී, යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය නාවික හමුදාවේ සේවය සඳහා යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයා විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලු වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

උ. සියලු නාවිකයින් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

7. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

8. වැටුප් හා දීමනා :

2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව,

| | | |
|---|---|---|
| අ. | මූලික වැටුප | - රු. 30,140.00 |
| ආ. | ජීවන වියදම් දීමනාව | - රු. 17,800.00 |
| ඇ. | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| ඈ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඉ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඊ. | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00 |
| | | - විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| උ. | අතුරු දීමනාව | - රු. 5,000.00 |
| | දළ වැටුප ආසන්න වශයෙන් (ආහාර දීමනාව ඇතුළත්ව) | - රු. 88,115.00 |

ඌ. නොමිලයේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට,ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

එ. කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඒ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට).

ඔ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු. 2,400.00 සිට රු. 6,600.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

ඕ. විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයෙ හි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

ක. මූලික පුහුණුවෙන් පසු පිටත වාසය කරන විවාහක නාවික පුද්ගලයින් සඳහා මසකට ආසන්න වශයෙන් රු. 30,000.00ක මුදලක් ආහාර දීමනාව වශයෙන් ගෙවනු ලබයි.

9. වරප්‍රසාද:

නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා විශේෂිත වූ උසස්වීම් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන අතර, ඒ අනුව ශිල්පීය නාවිකයින්ට පුරප්පාඩු මත පදනම් නොවූ උසස්වීම් ලබා ගැනීමේ හැකියාව ඇත.

10. අයදුම්කරුවන්ට උපදෙස් :

අ. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙ හි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් **2024 ජූලි මස 18 වැනි දින 1200 පැයට** ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්), නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "ආධුනික නාවික ශිල්පීන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195162, 011-7195155 මගින් ලබා ගත හැක.

ආ. රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන් හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරාගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය,
(2) අයදුම් කර ඇති අංශයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික,
(3) පාසල් හැරයාමේ සහතිකය,
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය,
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පුහුණුවක් සහ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,
(6) මෑතක දී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ වත්මන් සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී සිටී නම්) විය යුතුය.
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙ හි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. තෝරා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණ ආදිය:

අ. ඉහත අවශ්‍යතාවන් සපුරාලන අපේක්ෂකයින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා ඃ

| ඉසව්ව | කාලය (මිනිත්තු/තත්පර) | පිරිමි | කාන්තා |
|---|---|---|---|
| මීටර් 1600 දිවීම | | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| Push Up | මිනිත්තු 01 | 12 ක් හෝ ඊට වැඩි | 08 ක් හෝ ඊට වැඩි |
| Sit Up | මිනිත්තු 01 | 10 ක් හෝ ඊට වැඩි | 07 ක් හෝ ඊට වැඩි |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවිකයෙකු ලෙස බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ඈ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ජංගම දුරකථන අංකයට අදාළ ව වට්ස්ඇප් (whatsapp) පණිවුඩ මගින් පමණක් දැනුම් දෙනු ලබන අතර තැපැල් මගින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් දැනුම්දීම සිදු නොකෙරේ. තවද සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිඳු වියදමක් ගෙවනු නොලැබේ.

ඉ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඊ. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කල යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙකු වීමට හේතු වන්නේය.

උ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඌ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාශණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

ඒ. ශ්‍රී ලංකා නාවික හමුදාවට අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතු වන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

***සටහන*** - මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකුලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

යූවීඑම්පී පෙරේරා, ආර්එස්පී**, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයට ආධුනික නාවිකයින් බඳවා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. ඉල්ලුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. උපන් දිනය :————.

8. වයස ඃ අවුරුදු ඃ . . . . . . . ., මාස ඃ . . . . . . ., දින ඃ . . . . . (2024 ජූලි මස 18 වන දිනට)

9. උස (අඟල්) ඃ . . . . . . . පපුව (අඟල් - පිරිමි) ඃ . . . . . . . බර (කි්‍රි. ග්‍රෑ.) ඃ . . . . . .

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

11. දිස්ත්‍රික්කය :————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

14. දුරකතන අංකය :————.

15. වට්ස්ඇප් (Whatsapp) අංකය :————.

16. විවාහක හෝ අවිවාහක බව :————.

17. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් (අනුපිළිවෙලින් සඳහන් කරන්න)

19. පාසල/පාසල් හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ඃ

| *පාසලේ /විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ)<br>අ. පො. ස. (උ. පෙළ)<br>වෙනත් | | |

| *පාසලේ නම* | *අ.පො.ස උ/පෙළ පෙනී සිටි විෂයය ධාරාව* | *විභාගයට පෙනී සිටි වර්ෂය* |
|---|---|---|
| | භෞතික විද්‍යා විෂයය ධාරාව<br>ජීව විද්‍යා විෂයය ධාරාව<br>තාක්ෂණ වේදය විෂයය ධාරාව | |

20. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. දෙමව්පියන් පිළිබඳ විස්තර ඃ

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

24. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න.) :————.

25. සන්නද්ධ සේවා/ස්වේච්ඡා බල සේනාවේ/ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇග බැඳ තිබේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

28. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන බද්ධ ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුලුව) සේවයෙ හි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

29. චරිත සහතික පිළිබඳ විස්තර ඃ

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

30. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ*

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළවන ව්‍යවස්ථා රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

06-171

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.***- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 ජූලි මස 29 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 මැයි මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | ලුණුගල | ඔයපලාත නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ හා වියළුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

06-181

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

### 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මගින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙ හි නියුතුවන්නන්ගේ හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත එකම රාජ්‍ය ආයතනය වේ.

2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් පාඨමාලා සඳහා උසස්පෙළ සමත් සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. INDUCTION PROGRAMME IN PLANTATION MANAGEMENT AND TECHNOLOGY (IPPMT) - PLANTER TRAINEE PROGRAMME (සහකාර වතු අධිකාරී පුහුණු පාඨමාලාව)

| | | |
|---|---|---|
| කාලසීමාව | - | අවුරුදු එකකි. (01) |
| | - | අදියර I - මාස 06 ක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාව |
| | | අදියර II - මාස 06 ක වතු ආශ්‍රිත ප්‍රායෝගික පුහුණුව |
| මාධ්‍යය | - | ඉංග්‍රීසි |
| පාඨමාලා ගාස්තුව | - | අදියර I සඳහා රු. 450,000.00 (නේවාසික පහසුකම් සමඟ) |
| වයස් සීමාව | - | උපරිම වයස් සීමාව අවුරුදු 22 |

**ඇතුළත් වීමේ සුදුසුකම් :**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව යන විෂයන් තුනට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

*හා*

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනක් (03) සමත් වීම.

*හෝ*

කෘෂිකර්මය පිළිබඳ පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම.

**02. වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDPCT) NVQ මට්ටම 05**

| | | |
|---|---|---|
| කාලසීමාව | - | අවුරුදු එකයි මාස හයයි |
| | | අදියර I - අවුරුදු 01 ක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාව |
| | | අදියර II - මාස 06 ක ප්‍රායෝගික පුහුණුව |
| මාධ්‍යය | - | ඉංග්‍රීසි |
| පාඨමාලා ගාස්තුව | - | රු. 150,000.00 |

**ඇතුළත් වීමේ සුදුසුකම් :**

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනක් (03) සමත් වීම;

*හෝ*

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**අයදුම් කරන ආකාරය :**

මෙම පාඨමාලා සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.07.14** දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ආකෘතිය අනුව අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය, ශ්‍රී ලංකාව යන ලිපිනයට එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ www.nipm.gov.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව හෝ අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා :
011-2770232 071-9708664 077-3652586

FM/TR/03

# NATIONAL INSTITUTE OF PLANTATION MANAGEMENT

## APPLICATION FOR ADMISSION

**Name of the Programme**

**Name in Full : Mr. / Mrs. / Miss. / Dr. / Prof. ( Use BLOCK LETTERS)**

**Name with initials**

**Permanent address**

**Employer**

**Designation :**

**Tele. No.**

**Mobile No.**

**Official address**

**E-mail**

**National Identity card No.**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**Tele. No.**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**Marital status**

Single ☐
Married ☐

**Date of birth**

| Date | | Month | | Year | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**Fax No.**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**EDUCATIONAL QUALIFICATIONS**

**G.C.E (O/L) Examination**

| Subject | Grade | Year |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**G.C.E (A/L) Examination**

| Subject | Grade | Year |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**COURSE COMPLETED AT THE NIPM**

| Course | Year |
|---|---|
| | |
| | |
| | |

**PROFESSIONAL QUALIFICATIONS**

| Institute | Period | Qualification | Year |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**WORK EXPERIENCE**

| Organization | Period | Designation | Year |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**FINANCE**

How will you finance your professional studies at the institute?

Self ☐ Sponsored ☐

If sponsored, by whom ?

...................................... ......................................

Date Signature of the Sponsor

I hereby certify that the particulars furnished by me in this application are true & accurate and agree to abide by the rules and regulations governing the above course.

...................................... ......................................

Date Signature of the Applicant

**Payments Procedure for the programmes**

Payments can be made to the credit of NIPM Current Account No. 3697566 maintain at any branch of Bank of Ceylon ( BOC) and the printed "Customer Deposit Slip" should be forwarded to NIPM, Athurugiriya in order to obtain official receipt for payment. ( Name to be written in bank deposit slip for identification of the payee)

06-168

---

**අධ්‍යාපන අමාත්‍යාංශය - නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

ඉංජිනේරු තාක්ෂණ ආයතනය, කටුනායක

**ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2024 කණ්ඩායම (න්‍යායික අධ්‍යයන වාර ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී සහ ආයතනික අවශ්‍යතාව මත මාර්ග ගත ක්‍රමයට)**

**2024.03.15** දින අංක 2376 *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 03-308 හි පළ කරන ලද කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ''ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා'' පාඨමාලාව සඳහා 2024 වසරට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා වූ නිවේදනයේ අයදුම්පත් භාරගැනීම **2024.06.20** දින සිට **2024.07.08** දින දක්වා තවදුරටත් දීර්ඝ කිරීමට එම ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ අධ්‍යයන පාලක මණ්ඩලය තීරණය කොට ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් භාර ගැනීම **2024.06.20** දින ආරම්භ වී **2024.07.08** දින රාත්‍රී **12.00** ට අවසන් වන අතර, ඉංජිනේරු තාක්ෂණ ආයතනය ලියාපදිංචි තැපෑල ඔස්සේ අයදුම්පත් භාර ගැනීම **2024.07.22** දිනෙන් අවසන් වේ.

මේ සඳහා මෙවර (2024) අ.පො.ස. (උ.පෙළ) නිකුත් වූ ප්‍රතිඵල මගින් ද අයදුම් කළ හැක.

ඩී. ආර්. සපුතන්තිරි,
අධ්‍යක්ෂ/ විදුහල්පති.

06-158

---

**හෙල කෘෂි සංසදය**

BIHS

2024 වර්ෂය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම - ආරම්භය 2024 ජූලි

Course of Agriculture, Plantation, Livestock, Landscaping and Food Technology & Agri Business Management

කෘෂිකර්ම, වැවිලි, පශු සම්පත්, භූමි අලංකරණ සහ ආහාර තාක්ෂණ හා කෘෂි ව්‍යාපාර කළමනාකරණය පාඨමාලාව

පාඨමාලා කාල සීමාව - මාස 36 යි.
සතියකට දින දෙකයි. සවස 07.30 - සිට රාත්‍රී 10.30 දක්වා
මාධ්‍ය - සිංහල
සියලුම දේශන මාර්ගගත (Online) ක්‍රමයට

**පාඨමාලා සඳහා ඇතුලත් වීමට සපුරාලිය යුතු සුදුසුකම් :**

අ.පො.ස. (උ.පෙළ) විෂයන් දෙකක් සමත් අයට හෝ අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) කෘෂිකර්ම විෂය සමත් අයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ NVQ 4 පාඨමාලාවක් හදාරා සිටින අයට හෝ අ.පො.ස (සා.පෙළ) සමත් එක් එක් ක්ෂේත්‍රයන්හි වෘත්තීය පළපුරුදුතාවය අනුව ඉල්ලුම් කළ හැක.

ඉහත කිසිදු සුදුසුකමක් සපුරා නොමැති අයට අපගේ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව සම්බන්ධ විය හැක. ඔබ වැය කරන මුදලට උපරිම ප්‍රථිඵල අත්පත් කර ගත හැකි කෘෂිකර්ම, වැවිලි, පශු සම්පත්, භූමි අලංකරණ සහ ආහාර තාක්ෂණ හා කෘෂි ව්‍යාපාර කළමනාකරණය යන ක්ෂේත්‍ර පහම (05) ඇතුලත් විෂය මාලාවකින් යුත් දිවයිනේ එකම සිංහල කෘෂිකර්ම පාඨමාලාව.

**පාඨමාලා සැළසුම අන්තර්ගතය :**

මූලික කොටස් 06කින් සමන්විතය.

1. Agriculture Production Technology Management
   කෘෂි නිෂ්පාදන තාක්ෂණ කළමනාකරණය
2. Plantation Production Technology Management
   වැවිලි නිෂ්පාදන තාක්ෂණ කළමනාකරණය
3. Livestock Production Technology Management
   පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ කළමනාකරණය
4. Floriculture and Landscape Gardening Technology Management
   උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ තාක්ෂණ කළමනාකරණය
5. Food Production Technology Management
   ආහාර නිෂ්පාදන තාක්ෂණ කළමනාකරණය
6. Agriculture Business Management
   කෘෂි ව්‍යාපාර කළමනාකරණය

BIHS හෙල කෘෂි සංසදය උපරිමය ඔබට පුද කරමු.
ඔබව කෘෂිකර්මයේ හැම ලෙසින් ම දැනුමැත්තෙකු කිරීම අපගේ උත්තරීතර බලාපොරොත්තුවයි.
0728311631 දුරකථන ඇමතුමක් හෝ WhatsApp පණිවිඩයක් මගින්.

හෙල කෘෂි සංසදය

06-149

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

**2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම (සීමිත බඳවා ගැනීම්)**

2023 වර්ෂයේ හෝ ඊට පෙර අ.පො.ස. (උසස් පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන (SLIATE) යටතේ පවතින උසස් තාක්ෂණ ආයතන මගින් පවත්වනු ලබන වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණ කාලීන උසස් ජාතික ඩිප්ලෝමා ( HND) පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි/ සිටින සිසුන් 1978, අංක 1 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලබයි. (කරුණාකර අංක 2 සටහන බලන්න).

**අයදුම් කරන පිළිවෙල**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා apply.sliate.ac.lk වෙබ් අඩවිය මගින් පමණක් මාර්ගගතව අයදුම්කළ යුතු ය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ. අයදුම්කරුවන් අන්තර්ජාලය හරහා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී මෙන්ම අන්තර්ජාලය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේ දී ඇතුළත් වීමේ මාර්ගෝපදේශ කියවා තේරුම් ගත යුතු අතර, එහි ඇති නීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතු ය. ඇතුළත් වීමේ මාර්ගෙ ා්පදේශය මාර්ගගත අයදුම්පත සමග ලබාගත හැක.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පහත වගුවේ පරිදි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා කාණ්ඩ දෙකක් යටතේ පිරිනමයි.

| | |
|---|---|
| **කාණ්ඩ** - 1<br>Z ලකුණු මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HNDA, HNDBA, HNDBF, HNDE (Civil), HNDE (Mechanical), HNDE (Electrical & Electronics), HNDQS, HNDBSE, HNDT (Agriculture), HNDFT |
| **කාණ්ඩ** - 2<br>ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HND in English, HNDIT, HNDM, HNDPM, HNDTHM |

සුදුසුකම්ලත් අපේක්ෂකයින්ට Z අගය මත පදනම් වූ සහ ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ පාඨමාලා කාණ්ඩ දෙකෙන් උපරිම අවස්ථා 25 ක් දක්වා ඔවුන්ගේ ප්‍රමුඛතාව මත පදනම් ව

උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සංයෝජන තෝරාගත හැක.

උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහාවන ප්‍රවේශ සුදුසුකම් 'A' **කොටසේ** සහ උසස් තාක්‍ෂණ ආයතන (ATIs) පිළිබඳ විස්තර 'B' **කොටසේ** බලන්න.

සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට රු. 1,000ක් ගෙවා උසස් තාක්ෂණ ආයතනවල උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා (උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා සංයෝජන) උපරිම 25ක් ඉහත කාණ්ඩ දෙකෙන් ම ඉල්ලුම් කළ හැක.

අයදුම්පත් ගාස්තු සෘජුවම බැංකුවට ගෙවිය යුතු ය. මාර්ගගත ගෙවීම් පිළිගනු නොලැබේ.

බැංකු ගෙවීම් කුවිතාන්සියේ ගණුදෙනු යොමු අංකය (TRN) මාර්ගගත අයදුම්පතෙ හි සඳහන් කළ යුතු ය. **2024.07.19** හෝ ඊට පෙර මහජන බැංකුව, හයිඩ් පාර්ක් ශාඛාව, කොළඹ 02 හි, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ **ගිණුම් අංක 025-2 -001-1-3397613** වෙත ගෙවීම් බැර කළ යුතු ය. එම ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් ගෙවීම් සිදුකළ හැකි ය.

මාර්ගගත අයදුම්පත්‍රය තහවුරු කිරීමෙන් පසු, අයදුම්පත්‍රයේ පද්ධතිය මගින් උත්පාදිත මුද්‍රිත පිටපතක් ලබා ගන්න. අදාළ උසස් තාක්ෂණ ආයතනයෙ හි තෝරාගත් පාඨමාලාව සඳහා ලියාපදිංචි වනවිට, ඉහත අයදුම්පතෙහි අත්සන් කළ අයදුම්පත සහ ගෙවීම් ලදුපත ඉදිරිපත් කළ යුතුය.

මෙම ක්‍රියාවලිය තුළ දී සහ ඉන්පසුව අයදුම්පතේ තත්ත්වය කුමක්දැයි අප වෙත ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය මගින් හෝ ජංගම දුරකථන ඔස්සේ හෝ තැපැල් මගින් අයදුම්කරුට දන්වනු ලැබේ.

**අවසාන දිනයෙන් පසුව, තෝරාගත් අයදුම්කරුවන්ට සති දෙකක් ඇතුළත පද්ධතිය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි තහවුරු කරන ලෙස විද්‍යුත් තැපෑලෙන්/ කෙටි පණිවිඩ සේවාව (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. ලබා දී ඇති කාල සීමාව තුළ අයදුම්කරු මාර්ගගත පද්ධතිය හරහා ලියාපදිංචිය තහවුරු නොකරන්නේ නම්, ඔහු/ ඇය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙ හි කිසිදු උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා නැවත සලකා බලනු නොලබන අතර, ඔහුගේ/ ඇයගේ අයදුම්පත්‍රය අවලංගු වේ.**

*පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය :*

**පූර්ණ කාලීන පාඨමාලා (සතියේ දින)**
**අර්ධ කාලීන පාඨමාලා (සති අන්ත)**
**ඉගැන්වීමේ මාධ්‍යය - ඉංග්‍රීසි**

අර්ධ කාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයන් හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් පවත්වනු ලැබේ.

*පාඨමාලා ගාස්තු :*

**පූර්ණ කාලීන (Full-Time)** පාඨමාලා ගාස්තු - නොමිලේ

එක් අධ්‍යයන සමාසිකයක් වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ :-

- **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA)** - රු. 17,000.00
- **ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HND in English)** - රු. 17,000.00
- **උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව** (HNDIT) - රු. 30,000.00
- **ව්‍යාපෘති කළමණාකරණ පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව** (HNDPM) - රු. 20,000.00
- අර්ධකාලීන පාඨමාලා සඳහා ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතු ගාස්තුව - රු. 10,000.00

**ලියාපදිංචිය :**

ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේ දී අවශ්‍ය අධ්‍යාපනික සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**"A" කොටස**

***උසස් ජාතික ඩිප්ලෝමා** (HND) **පාඨමාලාවන් සඳහා ප්‍රවේශ සුදුසුකම් :***

01. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA)**

**01.1 පූර්ණ කාලීන - වසර 4ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය ද සහිතව අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**01.2 අර්ධ කාලීන - වසර 4ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය ද සහිතව අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරත ව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

*හෝ*

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම ;

*සහ*

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන්ව ඇති ඕනෑම සහතිකපත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

A. ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව
B. ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය
C. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය
D. ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය

*සහ*

අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ;

*සහ*

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයකුව) නිරත ව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

*සටහන 1* :

පහත සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් ඇති වාණිජ විෂය ධාරාවේ ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා අර්ධ කාලීන අයදුම්කරුවෙකු අනෙකුත් ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන්නේ නම් සහ උසස් තාක්ෂණ ආයතනවල ධාරිතාව තිබේ නම්, පළමු වසරෙන් නිදහස් කර දෙවන වසරට බඳවා ගනු ලැබේ.

(i) SLIATE විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

(ii) කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් තිබීම.

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යාපාර මට්ටම I සහ II (හෝ විධායක මට්ටම හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර් මාධ්‍ය මට්ටම හෝ බලපත්‍රලාභී I **සහ** II) සම්පූර්ණ කිරීම.

(iv) වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA -UK) I කොටස **සහ** II කොටස සම්පූර්ණ කිරීම.

(v) සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය (ACCA-UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(vi) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සම්පූර්ණ කිරීම.

(vii) සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA - Sri Lanka) විසින් පවත්වනු ලබන ආශ්‍රිත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ විභාගය (ACMA) සමත් ව තිබීම.

*සටහන 2* : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාර ව බඳවා ගැනීමේ පටිපාටියන්හි දී උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි, පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.

**02. උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමා පාඨමාලාව (HNDBA) පූර්ණ කාලීන - වසර 2 ½ ක්**

**03. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (HNDBF ) පූර්ණ කාලීන - වසර 2 ½ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) වාණිජ විෂයය ධාරාව යටතේ එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

*සහ*

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**04. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) HNDE (Civil) - පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**05. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (විදුලි සහ විද්‍යුත්) HNDE (Electrical and Electronics) - පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (යාන්ත්‍රික) HNDE (Mechanical) - පූර්ණ කාලීන වසර 3 ½ක්**

**07. උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව HNDQS - පූර්ණ කාලීන - වසර 2 ½ක්**

**08. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව HNDBSE -පූර්ණ කාලීන - වසර 3½ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

භෞතික විද්‍යා විෂය ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය)

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**9. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)**

9.1 **පූර්ණ කාලීන- වසර 2 ½යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස නොසැලකේ.) ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ;

*හෝ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

9.2 **අර්ධ කාලීන - වසර 2 ½ක්**

9.1 හි සුදුසුකම්වලට අමතරව, අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුක්ත (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDFT) පූර්ණ කාලීන වසර 2 ½යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDIT)**

11.1 **පූර්ණ කාලීන - වසර 2 ½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

11.2 **අර්ධ කාලීන - වසර 2 ½යි.**

11.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව, අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**12. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව** (HNDM) **පූර්ණ කාලීන - වසර 3 ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**හෝ**

(ii) කාර්මික අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගිණුම්කරණ කාර්මික ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය **හෝ** ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය (රාජ්‍ය පරිපාලන/අලෙවිකරණය) ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**13. උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව (HNDPM)**

13.1 **පූර්ණ කාලීන - වසර 2 ½ යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය ;

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවරක දී අ.පො.ස. උ/පෙළ විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ලබා තිබීම.

13.2 අර්ධ කාලීන - වසර 2 1/2

13.1 හි ඉහත සුදුසුකම්වලට අමතරව, අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක/ පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**14. උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT- Agriculture)**

**පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) ජීව විද්‍යාව විෂයය ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. (ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව සමඟ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය විෂයයන් ඇතුලත්ව) ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

*හෝ*

(ii) ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් ඇතුළත්ව, ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

(iii) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**15. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)**
**පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) ඕනෑම විෂයය ධාරාවකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**"B" කොටස**

උසස් තාක්ෂණ ආයතනවල **(ATIs)** නම්, ලිපිනයන්, දුරකථන අංක සහ උසස් ජාතික ඩිප්ලෝමා **(HND)** පාඨමාලා
**[පූර්ණ කාලීන (FT) සහ අර්ධ කාලීන (PT)]**

| *අංකය* | *උසස් තාක්ෂණ ආයතනයේ නම* | *ලිපිනය* | *දුරකථන අංක* | *පවත්වනු ලබන පාඨමාලා* |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය - අම්පාර | මහාචාර්ය එවන් ඒ හාඩි මාවත, අම්පාර | 063-2222056<br>063-2223035 | HNDT (Agriculture)(FT), HNDA (FT), HNDM(FT), HNDIT (FT), HNDTHM(FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT) HNDIT(PT) |
| 02 | උසස් තාක්ෂණ ආයතනය - අනුරාධපුරය | අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම, අනුරාධපුරය | 025-2234417 | HNDIT(FT), HNDA (FT), HND in English (FT), HNDIT(PT) HNDA (PT),<br>HND in English (PT) |

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 03 | උසස් තාක්ෂණ ආයතනය - බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT (PT), HNDA (PT),HND in English (PT) |
| 04 | උසස් තාක්ෂණ ආයතනය - මඩකලපුව | කෙලින් වීදිය, කෝවිල් කුලම් නැගෙනහිර, ආරයම්පති, මඩකලපුව | 065-2247519<br>065-2247470 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HNDIT (PT) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය - කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15 | 011-2521152<br>011-2521282 | HNDE (Civil)(FT) , HNDE Mechanical) (FT), HNDE (Electrical & Electronics) (FT), HNDQS(FT), HNDBSE(FT) |
| 06 | උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDBF(FT), HNDTHM(FT), HNDA (PT), HND in English (PT) |
| 07 | උසස් තාක්ෂණ ආයතනය - ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන, ගාල්ල. | 091-2246179 | HNDE (Civil)(FT), HNDE(Mechanical) (FT), HNDE(Electrical & Electronics) (FT) HNDQS(FT), HNDIT (FT), HNDT(Agriculture) (FT) HNDA (FT), HNDM(FT), HNDTHM(FT), HNDBA(FT), HND in English (FT), HNDA (PT), HNDIT (PT) |
| 08 | උසස් තාක්ෂණ ආයතනය - ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | HNDT (Agri) (FT), HNDIT (FT), HNDFT(FT), HNDA (FT), HNDA (PT),), HNDIT (PT), HND in English (PT) |
| 09 | උසස් තාක්ෂණ ආයතනය - යාපනය | අංක 665/2, වෙරළ පාර, ගුරුනගර්, යාපනය | 021-2222595<br>021-2229803 | HNDE (Civil)(FT) , HNDE (Electrical & Electronics)(FT), HNDA (FT), HND in English(FT), HNDQS(FT), HNDM(FT), HNDIT (FT), HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය - මහනුවර | අංක 16, කැප්පෙටිපොල මාවත, මහනුවර | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HNDBA(FT), HND in English (FT), HNDTHM (FT), HNDA (PT),HND in English (PT), HNDIT (PT) |
| 11 | උසස් තාක්ෂණ ආයතනය - කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල. | 035-2221297<br>035-2221713 | HNDIT(FT), HNDA(FT), HND in English (FT), HNDPM(FT), HNDA (PT), HND in English (PT) HND PM (PT) |
| 12 | උසස් තාක්ෂණ ආයතනය - කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2229583<br>037-2224911 | HNDIT(FT), HNDA(FT), HNDM(FT) HND in English (FT), HNDTHM(FT) HNDIT (PT), HNDA (PT), HND in English (PT) |

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 13 | උසස් තාක්ෂණ ආයතනය - මන්නාරම | උයිලන්කුලම්, මන්නාරම | 023-3122555 076-7966111 | HND IT, HND in English (FT), HNDIT (FT) |
| 14 | උසස් තාක්ෂණ ආයතනය -නාවලපිටිය | හයින්ෆෝඩ් වත්ත, නාවලපිටිය | 077-6594248 | HNDTHM(FT), HNDM(FT), HND BF (FT), HND in English (PT) |
| 15 | උසස් තාක්ෂණ ආයතනය - රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492 045-2231493 | HNDIT (FT), HNDA (FT), HND in English (PT), HNDA (PT) HND in English (PT) |
| 16 | උසස් තාක්ෂණ ආයතනය - සමන්තුරය | උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරය | 067-2261304 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDM (FT) HNDIT (PT) HNDA (PT), HND in English (PT) |
| 17 | උසස් තාක්ෂණ ආයතනය - තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය, තංගල්ල | 047 2241845 047 2241846 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HND IT (PT) |
| 18 | උසස් තාක්ෂණ ආයතනය - ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝතය නගර්, ත්‍රිකුණාමලය | 026 2223232 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 19 | උසස් තාක්ෂණ ආයතනය - වවුනියාව | ඒ 9 පාර, වෙප්පන්කුලම්, ඕමාන්තෙයි, වවුනියාව | 024 2052733 077-662010 | HNDA (FT), HND in English (FT), HND IT (FT) HNDA (PT), HND in English (PT), HND IT (PT) |

*සටහන 3 :*

01. අයදුම්කරු අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

02. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවතින උසස් තාක්ෂණ ආයතන මගින් පවත්වනු ලබන වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත) වරින්වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලබයි.

ලබන වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාඃ

(i.) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA)
(ii.) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) HNDE (Civil)
(iii.) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා විද්‍යුත්) HNDE (Electrical and Electronics)
(iv.) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික) HNDE (Mechanical)
(v.) උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDBSE)
(vi.) උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT - Agriculture)
(vii.) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව (HNDM)
(viii.) උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)

03. පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීමේ දී වයස අවුරුදු 23 ට අඩු අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එමෙන් ම, 2023 වර්ෂයේ අ.පො.ස. (උ:පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට ද ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

04. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා, එම අධ්‍යයන පාඨමාලාවට අවම වශයෙන් සිසුන් 50 ක් ලියාපදිංචි විය යුතුය. යම් පාඨමාලාවක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක, එම සිසුන් එම පාඨමාලාවකම පවත්වනු ලබන ආසන්න ම උසස් තාක්ෂණ ආයතනය වෙත ස්ථාන මාරු කරනු ලැබේ. මේ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ තීරණය අවසාන තීරණය වේ.

05. සියලුම පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන්, සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්ත දිනවල ද දේශන සඳහා සහභාගී විය යුතුය.

06. අර්ධකාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.

07. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ ප්‍රධාන වශයෙන් දේශන ශාලාගතව (පන්ති මට්ටමින්) වේ. කෙසේ වෙතත් අවශ්‍යතාවය අනුව පන්ති කාමර තුල දේශන පැවැත්වීම මෙන් ම මාර්ගගතව දේශන පැවැත්වීම ද සිදු කරනු ලැබේ.

08. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමු වසර හා දෙවන වසරවල අධ්‍යයන කටයුතු සතියේ දිනවල දී පමණක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහාවන දේශන සති අන්තයේ දී පැවැත්වේ.

09. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06 ක කාලයක් අදාළ ක්ෂේත්‍රයේ කර්මාන්ත පුහුණුවක් ලබාගත යුතුය. අර්ධකාලීන සිසුන් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස හයක ව්‍යාපෘතියක්/ කර්මාන්ත පුහුණුවක් ලබාගත යුතුය.

10. අර්ධ කාලීන අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරත ව සිටිය යුතුය.

11. යම් සිසුවෙකු පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරා ගැනීමෙන් පසුව වෙනත් කිසිදු උසස් තාක්ෂණ ආයතනයක් වෙත කිසිදු හේතුවක් මත ස්ථාන මාරු කරනු නොලැබේ.

12. ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට කිසිදු ගාස්තුවකින් තොරව අදාළ ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචි වීමේ අවසන් දිනයේ සිට දින 60 ක් ඇතුලත ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අවසර දෙනු ලැබේ.

13. (i) දින 60 කට පසුව ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් රැඳී සිටි කාලය සඳහා මසකට රු.5,000.00 ක් බැගින් අයකෙරේ. උපරිමය රු. 30,000.00 ක් මාස හයක් හෝ ඊට වැඩි කාලයකට පසු තුළ ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් අයකෙරේ.

(ii) අර්ධකාලීන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ දී, රු.10,000.00ක් ආපසු ගෙවිය හැකි මූලික මුදල් තැන්පතුව ලෙස අයකරනු ලබන අතර, එය පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලැබේ. ශිෂ්‍යයා පාඨමාලාව අවසන් කිරීමට පෙර පාඨමාලාව හැර ගියහොත්, මෙම තැන්පතුව ආපසු ගෙවනු නොලැබේ. ලියාපදිංචියේ දී සම්පූර්ණ ගාස්තුව එකවර ගෙවන අර්ධකාලීන අයදුම්කරුවන් හට 10% ක වට්ටමක් ලබාදෙනු ඇත.

14. සතියේ දිනවල සහ සති අන්ත දිනවල පූර්ණ කාලීන හා අර්ධ කාලීන සිසුන් සඳහා සමාසික අවසාන වාර විභාග පවත්වනු ලැබේ.

15. අ.පො.ස (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) විභාග පාලනය වී තිබිය යුත්තේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.

16. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති ඕනෑම අයදුම්කරුවකුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

18. උසස් තාක්ෂණ ආයතනවල (ATIs)හි පවතින ආසන ධාරිතාව මත පදනම් ව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

19. වැඩිදුර තොරතුරු සඳහා www.sliate.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024.07.19 දින වේ.**

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE).

06 - 182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.